බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2013 (2014)

(03) අභිධර්මය

කාලය පැ. 3 යි.

(I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.)

I කොටස

01. i. අභිධර්මයේ දැක්වෙන " චතුර් භූමි" නම්කර එක් එක් භූමියට අදාළ සිත් සංඛ්‍යාව දක්වන්න.

....

....

....

....

ii. චිත්ත හා චෛතසික අතර සම්බන්ධතාව පිළිබඳ ව කියැවෙන ලක්‍ෂණ අතර ඇත " ඒකාලම්භන" යන්නෙන් කුමක් අදහස් කෙරේ ද? හඳුන්වන්න.

....

....

....

iii. විරති චෛතසික පිළිවෙළින් නම් කරන්න.

....

....

....

iv. අකුසල චෛතසික අතර ඇති " ලෝභ ත්‍රිකයට" අයත් චෛතසික පිළිවෙළින් නම් කරන්න.

....

....

....

v. "උද්ධච්ච" සහ "කුක්කුච්ච" යන චෛතසික දෙකෙහි මූලික ලක්‍ෂණ පෙන්වා දෙන්න.

....

....

....

vi. සමථ භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵල තුනක් පෙන්වා දෙන්න.

....

....

....

....

vii. " ගෝචර රූප (විෂය රූප) යන්න හඳුන්වා, එහි සිවු වැදෑරුම් ප්‍රභේද නම් කරන්න.

....

....

....

....

viii. මධුපිණ්ඩික සූත්‍රය අනුව "තිණ්ණං සංගති ඵස්සෝ" යන පාඨයට අදාළව ශබ්දමය ඵස්සයක් හෙවත් ස්පර්ශයක් ඇතිවීමට හේතු වන සාධක තුන නම් කරන්න.

....

....

....

ix. "කෝලංකෝල" සෝතාපන්න පුද්ගලයා යනු කවරෙක් දැයි හඳුන්වන්න.

....

....

....

x " සමථ" භාවනාවේ මූලික අරමුණ කුමක් ද?

....

....

....

....

....

* * *

බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2013 (2014)

(03) අභිධර්මය

කාලය පැ. 3 යි.

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

II කොටස

02. i. "සුත්ත පරියාය" පිළිබඳව හැඳින්වීමක් කරන්න.

ii. "ථෙරවාදී විභජ්ජවාදී අභිධර්ම සම්ප්‍රදායයෙහි" දක්නට ලැබෙන විශේෂ ලක්‍ෂණ පෙන්වා දෙන්න.

iii. ථෙරවාදී නොවන වෙනත් අභිධර්ම සම්ප්‍රදායයන් දෙකක් දක්වා එයින් එකක් ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

03. i. අභිධර්මයේ දී "ධම්ම " යන පදය යොදාගෙන ඇති අර්ථය දක්වමින් එය සතර

ii. "උප්පාදො පඤ්ඤායති, වයෝ පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති" යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

iii. මූලික කරුණු ඇතුළත් වනසේ විදර්ශනා භාවනාව පිළිබඳ හැඳින්වීමක් කරන්න.

04. i. කාමාවචර හා කුසල් සිත් සංඛ්‍යාව දක්වා එම සිත්වලින් පළමු සිත හා අවසාන සිත ලියන්න.

ii. කුසල් සිතක් " සෝමනස්ස සහගත" වීමට හේතුවන කරුණු පැහැදිලි කරන්න.

iii. කුසල් සිත්වල යෙදෙන "ඥාණ සම්ප්‍රයුක්ත" සහ " ඥාණ විප්‍රයුක්ත" යන ස්වභාවයන් පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න.

05. i. සෝභන රාශියේ චෛතසිකයන්ගේ මූලික ප්‍රභේද දක්වා ඒවාට ඇතුළත් වන චෛතසික සංඛ්‍යාව ලියන්න.

ii. විරති චෛතසික පිළිවෙළින් නම් කර ඒවා විරති ලෙස හැඳින්වීමට හේතුව පැහැදිලි කරන්න.

iii. විරති චෛතසික පදනම් කරගනිමින් සීලය පිළිබඳව විස්තරයක් කරන්න.

06. i. කර්මයෙන් කෙරෙන කෘත්‍ය සතර පිළිවෙළින් නම්කර එයින් දෙවැනි හා තෙවැනි ප්‍රභේද පිළිබඳව පැහැදිලි කරන්න.

ii. ප්‍රාණඝාත අකුසල කර්මය සම්පූර්ණ වීමට හේතුවන කරුණු දක්වමින් ඒ පිළිබඳව විස්තර කරන්න.

iii. පන්සිල් සුරැකීම පුද්ගල සංවර්ධනයට හා සමාජ සංවර්ධනයට හේතුවන අයුරු පෙන්වා දෙන්න.

07. i. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා පිළිවෙළින් නම්කර එයින් තෙවැන්නා පිළිබඳව මූලික ප්‍රභේද ඇතුළත් වනසේ හැඳින්වීමක් කරන්න.

ii. "සීලං නිස්සාය චත්තාරෝ සතිපට්ඨානෙ භාවෙය්‍යාථ" යන්න අර්ථ දක්වමින් පැහැදිලි කරන්න.

iii. මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ආනිසංස පුද්ගල හා සමාජමය වශයෙන් වැදගත්වන ආකාරය පෙන්වා දෙන්න.

08. i. නීවරණ යන්න හඳුන්වා පංච නීවරණ පිළිළෙින් නම් කරන්න.

ii. පළමුවැනි නීවරණය පිළිබඳව උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

iii. පුද්ගල සන්තානයේ පරිහානියට නීවරණ බලපාන ආකාරය නිදර්ශන සහිතව පෙන්වා දෙන්න.

09. i. උද්ධම්භාගිය සංයෝජන ධර්ම පිළිවෙළින් නම් කරන්න.

ii. " ක්ලේශ පරිනිර්වාණය" " ස්කන්ධ පරිනිර්වාණය" යන මූලික ප්‍රභේද දෙක පැහැදිලි කරමින් නිවන් අවබෝධය පිළිබඳව හැඳින්වීමක කරන්න.

iii. තදංග ප්‍රහාණය, විෂ්කම්භන ප්‍රහාණය, සමුච්ඡේද ප්‍රහාණය යන සංකල්ප ඇතුළත් වනසේ කෙලෙස් ප්‍රහාණය පිළිබඳව විස්තරයක් කරන්න.

* * *